26 වන පිටෙන්

ස්වාධීන ශිෂ්‍ය කණ්ඩායමක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ද බිහිවෙතැයි යන බිය නිසා බව එදා හොඳින් පැහැදිලි විය.

මද කලකට පසු මා ඇතුළු කණ්ඩායමේ විශ්වවිද්‍යාල පාඨමාලා අවසාන විය. අපි විසිරී ගොස් විවිධ රැකියාවන්හි යෙදෙමින් අපේ කුසලතා ප්‍රගුණ කරන්නට පටන් ගත්තෙමු. විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය ව්‍යාපාරයේ කටයුතු කළ ද, පක්ෂ දේශපාලනයකට කිසිදු සම්බන්ධතාවක් අපේ නොතිබුණු නිසා, රටේ සහ ලෝකයේ දේශපාලනය පිළිබඳව අවබෝධයෙන් සිටීම, දේශපාලන රැළියක් නැරඹීමට යෑම, සඟරාවක් කියවීම හැර අපේ වෙනත් දේශපාලන ක්‍රියාකාරකමක් තිබුණේ නැත.

වසරකට පමණ පසු දිනයක උදෑසන දිවයින පුවත්පතේ පළ වී තිබුණු ප්‍රවෘත්තියකින් කියවුණේ කොළඹ විශ්වවිද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ නායක දයා පතිරණව කුරිරු ලෙස පිහියකින් කපා මරා දමා ඇති බවයි. ඔහු සමග සිටි සොමසිරි නම් තවත් ස්වාධීන ශිෂ්‍ය සංගමයේ සාමාජිකයෙකු ද බරපතල තුවාල ලබා සිටියේ ය. සාකච්ඡාවක් සඳහා කළ ආරාධනයකට මුවා වී දයා පතිරණව සුදු වෑන් රථයකින් පැහැරගෙන ගොස් එලෙස මරා දමා ඇත්තේ කලින් සමාජවාදී ශිෂ්‍ය සංගමය නමින් හැඳින්වුණු, පසුව අවස්ථාවාදී දේශපාලන අවශ්‍යතා නිසා දේශප්‍රේමී ශිෂ්‍ය සංගමය ලෙස නැවත බෞතීස්ම ලබා සිටි ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ශිෂ්‍ය සංගමයේ අනුග්‍රහයෙන් බව පසුව හෙළි වූ අතර, ඒ ක්‍රියාන්විතයට, මා පෙර නම සඳහන් කළ කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකුව සිටි ජවිපෙ හිතවාදියෙකු ද සක්‍රීයව සහභාගී වූ බව ද පැවසුනි.

දයා පතිරණගේ මරණයෙන් සති දෙකකට පමණ පසු වෙනත් කටයුත්තකට නගරයට ගිය මා, හවස් වරුවේ කොළඹ විශ්වවිද්‍යාලයට ගොඩ වැදුණෙමි. මුළු විශ්වවිද්‍යාලය ම ස්වාධීන ශිෂ්‍ය සංගමයේ බලයට නතුව තිබුණු අතර, ජනතා විමුක්ති පෙරමුණ සහ එහි ශිෂ්‍ය අංශය වූ දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරයට විරුද්ධ පෝස්ටර් යනාදියෙන් විශ්වවිද්‍යාල භූමිය පිරී තිබුණි. ඒ අතර කැපී පෙනෙන ලෙස ගොඩ නංවා තිබුණු කටවුට් වර්ගයේ පුවරුවක විශාල අකුරෙන් ලිය වී තිබුණු පහත කවිය දැක මම විමතියට පත්වීමි.

අසාධාරණයෙ අඳුර බිඳින්නට
හිරු පායන තෙක් සිටි කාලය ඇති
බලහත්කාරෙන් හෝ හිරු පුබුදා
හෙට මුළු ලෝකය එළිය කළ යුතුය

ඒ මා ඊට වසර ගණනට පෙර ලියූ, එහි දැක්වෙන දේශපාලනය ප්‍රතිගාමී බවට ජනතා විමුක්ති පෙරමුණෙන් අවවාද ලැබීමට හේතුභූත වූ, මගේ කවියයි. ඒ ස්ථානයේ කාටූන් සහිත පෝස්ටරයක් අඳිමින් සිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මිතුරෙකුවන දර්ශක හේරත්ට මගේ ඒ කවියේ ඉතිහාසය විස්තර කරනු ඇසී මා හමුවට ආ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ නායකත්වය බාරගෙන සිටි ධර්මසිරි, මගේ සිතේ ඒ වන විශාල කුතුහලයක් ඇති කර තිබුණු ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නේ ය.

ඊට වසර දෙකකත් ඉහත මා ලියූ ඒ කවිය කොළඹ විශ්වවිද්‍යාලයේ භාවිතයට පැමිණ ඇත්තේ, එජාප රජය විසින් පද්මසිරි අබේසේකර සහ රෝහණ රත්නායක ශිෂ්‍යයින් ඝාතනය කිරීමේ සංවත්සරය සනිටුහන් කිරීමට මගේ සංස්කාරත්වයෙන් ප්‍රකාශනය වුණු සමරු කලාපයෙනි. මගේ කවියේ අදහසට දයා පතිරණ ඇතුළු ස්වාධීන ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් ද ඇලූම් කළ නිසා එය පසුගිය කාලය පුරාම තම ප්‍රචාරක පෝස්ටර් සඳහා යොදා ගත් බව එදා ධර්මසිරි මා සමග පැවසීය. ජනතා විමුක්ති පෙරමුණ සහ ස්වාධීන ශිෂ්‍ය සංගමය අතර ප්‍රකාශිත දේශපාලනමය වෙනස මට එමගින් පැහැදිලි විය. ස්වාධීනයෝ බලහත්කාරෙන් වුව හිරු පිබිදිය යුතු යැයි සිතූහ.

ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය එලෙස බලහත්කාරෙන් හිරු පිබිදීම ප්‍රතිගාමී අදහසක් යැයි බැහැර කරන්නන් බව (උපාලි ජයවීරගේ සාකච්ඡාව නිසා) පෙනුණි.

ජනතා විමුක්ති පෙරමුණ විසින් අරඹන ලද දීර්ඝකාලීන ඝාතන රැසක ආරම්භය සනිටුහන් කරමින් දයා පතිරණ මරා දැමීම සිදුවූයේ 1986 දෙසැම්බරයේ දී ය.

ඉන් වසර එකහමාරකට පසුව, 1987 ජූලි මාසයේ දී අත්සන් කෙරුණු ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම සහ ඉන්දීයානු සාම සාධක හමුදාවේ ආගමනය දඬමීමා කරගෙන ජනතා විමුක්ති පෙරමුණ විසින් පෙර කී දේශප්‍රේමී ශිෂ්‍ය සංවිධානය මෙන් ඔවුන් ඒ වන විට ගොඩනගාගෙන සිටි දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය සහ වෙනත් නොයෙකුත් බලකායන් හරහා රට පුරා ත්‍රස්තවාදී කටයුතු ඇරඹූහ. මූලිකව ඔවුන්ගේ විරෝධය යොමු කෙරුණේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීම සඳහා රජය විසින් අනුගමනය කරමින් තිබූ වැඩ පිළිවෙළට වුව ද, ජනතා විමුක්ති පෙරමුණේ අවසාන අරමුණ වූයේ ත්‍රස්තවාදය හරහා රට අකර්මණ්‍ය කර රාජ්‍ය බලය ඩැහැ ගැනීම බව පැහැදිලිවම පෙනෙන්නට තිබුණි. එනම්, කාව්‍යමය භාෂාවෙන් කියතොත් ඔවුන්ගේ ඒ වෑයම වූයේ බලහත්කාරෙන් හිරු පිබිදවීමයි.

ජනතා විමුක්ති පෙරමුණේ ඒ ක්‍රියාන්විතය ආරම්භයත් සමගම, තම නායකයා වූ දයා පතිරණ මරා දැමීමේ පලිය ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයෝ ද රජයේ බලවේග හා එක්ව විවිධ ආයුධ සන්නද්ධ හිංසාකාරී කණ්ඩායම් සාදා ඒ හරහා ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකයින් කොටු කර ගැනීමට ද, ඒ පුද්ගලයින් සඳහා වධකාගාර පවත්වාගෙන යාමට ද, අවසානයේ ඔවුන් ඝාතනය කිරීමට ද පෙළඹුණාහ. ජනතා විමුක්ති පෙරමුණ මගින් ඇරඹූ බලහත්කාරෙන් හිරු පිබිදවීමේ විප්ලවයට ස්වාධීනයින් විරුද්ධ වූයේ එසේ ය.

වසර ගණනාවකට ඉහත කාලයක කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගමයේ සහ ලාංකික ශිෂ්‍ය ව්‍යාපාරයේ බලය සඳහා මතවාදීව ඇරඹුණු මේ දෙපිරිසේ අරගලය, බාහු බලය, පුටු කකුල්, කඩු කිනිසි, ගල්කටස්, වධකාගාර සහ තුවක්කු හරා ඇදී ගොස් අවිගත්තන් අවියෙන් ම නැසී ගියහ. ජනතා විමුක්ති පෙරමුණ විසින් ආරම්භ කර, රජයේ සහ වෙනත් කණ්ඩායම්වල සහභාගීත්වයෙන්, තරුණ ජීවිත හැට දහසකට වඩා විනාශ කර දමමින්, දෙවසරකටත් වඩා වැඩි කාලයක් තිස්සේ ලංකාවේ පැවති භීම සමය පසුබිම් කරගෙන හෙන්රි වර්ණකුලසූරිය විසින් රචනා කරන ලද "නාදුනන තුවක්කුකරුවාගේ කතාව" නම් ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවයේ දී එහි ප්‍රධාන දේශකයා වන ලයනල් බෝපගේ විසින් පැවැත්වූ "බලහත්කාරයෙන් සමාජවාදය ගොඩ නැගිය හැකිද?" යන දේශනය මතු දිනයක දී මුද්‍රිත මාධ්‍යකින් හෝ දැක ගැනීමට හැකි වේ යැයි සිතමි.

**රසික සූරියආරච්චි**




# පිළිකුල් භාවනාව

ප්‍රධාන භාවනාවට පෙර සිදු කැරෙන චතුරාරක්ඛ භාවනාවේ පළමුවැන්න වූ බුදුගුණ භාවනාවෙත් දෙවැන්න වූ මෛත්‍රී භාවනාවේත් යෙදුණු මට මගේ සිතේ තැන්පත් බව, ශාන්ත බව ක්‍රමයෙන් වැඩි වන අයුරු හැඟිණ. ඊළඟට මා එළඹෙන්නේ තුන්වැන්න වූ පිළිකුල් භාවනාවට යි.

මගේ පැතුම නිවනයි. නිවන් ලැබීමට සියල්ල සිතින් අත්හළ යුතුයි. රූපස්කන්ධ ධර්මයන් පිළිබඳ සියලු ඇලීම් බැඳීම්වලින් වෙන් විය යුතු යි. මුලින් ම රූපස්කන්ධය හෙවත් ශරීරය පිළිබඳ ව ඇලීම් බැඳීම් අත්ළ යුතු යි. ඒ අත්හැරීමට ඒ පිළිබඳ කලකිරීමක් අවශ්‍ය යි. කලකිරීමට පිළිකුලක් අවශ්‍යයි. පිළිකුල නිසා, කලකිරීම නිසා, ඒ පිළිකුල, කලකිරීම ගැඹුරෙන් ම ඇතුළු වූ නිසා මගේ ශරීරය පිළිබඳ ඇති මානය, ආශාව, කැමැත්ත, අනුන්ගේ ශරීර පිළිබඳ ඇති ආශාව තණ්හාව අඩු වේ. එවිට ඇලීම බැඳීම නැති වේ.

මම මගේ ශරීරය දෙස සිතින් බලමි. සිත සිහින් රෙදි කඩක් සේ ගෙන හිසේ සිට දෙපතුල දක්වා පිරීමැදගෙන යමි. මුළු සිරුර ම සිතට හසු වේ.

මගේ ම ශරීරය මගේ ඉදිරිපිට තිබෙනු මම සිතින් දකිමි. එහි ඇති දෑස දෙස බලමි. එයින් කඳුළු ගලයි. කබ පිරෙයි. කඳුළු, කබ, කබ නිසා ඇස් පිහාටු ඇලී ඇත. කහ පාටට සුදු පාටට කබ කුට්ටි.....

මම නාසය දෙස බලමි. සොටු ගලයි. කහ සුදු සොටු, සොටු දියර, සොටු කුට්ටි, උඩ තොලට සොටු වැටෙයි. දුගඳ ක් ද එයි.

මම කට දෙස බලමි. කෙළ, සෙම, කැහි ගලයි. කහ පාට සුදු පාට සෙම, කැහි කුට්ටි, කට අරින වි ටමහ දුගඳක් එයි.

කන් දෙස බලමි. කන් සිදුරු වල කලාඳුරු පිරිලා. එයින් දියරයක් ගලා එයි. ඉවසුම් නොදෙන දුගඳක් ගලා එයි. ඉවසුම් නොදෙන දුගඳක්.

මුත්‍ර මාර්ගයෙන් ගලා එන මුත්‍ර දුගඳ හමයි. මුත්‍ර වැටුණු තැන සෝදා නොදැමුව හොත් පැයෙන් දෙකෙන් මහ දුගඳක්, මළ මාර්ගයෙන් වැගිරෙන අශූචි, විටෙක ඝන මඩ මෙන්, දියරයක් මෙන් ගලා එය අශූචි මහා දුගඳක් සමඟ ශරීරයෙන් පිට වෙයි.

මේ සියල්ල පැමිණියේ මේ ශරීරය තුළින්, පිට වුණේ සිදුරු නවයකින්, දොරටු නවයකින්, මේ නව දොරටුවෙන් ගලා ගිය අශූචි පිරුණු මේ ශරීරය අශූචි ගබඩාවක්. දොරටු නවයකින් අශූචි පිටතට ගලා යන අශූචි ගබඩාවක් මේ ශරීරය.

මට බුදු රජාණන් වහන්සේ මාගන්දියට කී කතාව සිහි වෙයි. ඇය දඹදිව සිටි රූප සුන්දරියක්. ඇගේ පියාට ඇය බුදු රජාණන් වහන්සේට පාවා දීමට අවශ්‍ය වුණා. ඇය කැඳවාගෙන ආ පියා ඇය බුදුහිමියන්ට ඉදිරිපත් කළා.

"මගේ පයේ ඇඟල්ලකින්වත් මේ අශූචි ගබඩාව මා ස්පර්ශ කරන්නේ නැහැ." බුදු හිමියන් වදාළා.

රූමතියක සේ හැඳින්වුණු ඇය අශූචි ගබඩාවක්, අද සිටින රූමත් ය යි සැලකෙන සිනමා නිළියක් මගේ සිතට නැගුණා. අර දොරටු නවයෙන් අශූචි වැගිරෙන හැටි මට පෙනෙන්නට පටන් ගත්තා. ඇලීමෙන් බැඳීමෙන් තොර ව රූමත් නිළිය දෙස මා බලා සිටියා. ඇති වුණේ පිළිකුලක්. මා සිතින් ඇගේ සම ඉවත් කළා. මේද ලේ සෙම මස් සහිත, පිළී ගඳක් හමන සිරුර මට පෙනෙන්නට පටන් ගත්තා.

මගේ ශරීරයත් අනෙක් හැම දෙනාගේ ශරීරත් ඔහොමයි. පිළිකුල්, පිළිකුල්.

මේ අශූචි ගබඩාව නො වේ ද ආශාවෙන් සිපගත්තේ. වැළඳ ගත්තේ. මම මේ රූපස්කන්ධය පිළිකුල් කරමි. අත්හරිමි.

මම ඒ පිළී ගඳ හමන, හම නැති සිරුර දෙස, නව දොරටුවෙන් අශූචි ගලන ගබඩාව දෙස සිතින් බලා සිටියෙමි. ලබන සතියේ මරණ සති භාවනාව.